මගේ අංකය: ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු 2025

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) වාර්ෂික ස්ථානමාරු - 2025</u>**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඖ. (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය පරිදි සිදු කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරී) සේවාවේ වාර්ෂික ස්ථානමාරු නියෝග මේ සමඟ අමුණා ඇති <u>**ඇමුණුම - A** (Annexure - A)</u> හි සඳහන් වේ.

- **<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරී) සේවාවේ වාර්ෂික ස්ථානමාරු 2025 ජනවාරි මස 06 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.</u>**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ තනතුරු ආශ්‍රිතව අධිකරණවල දැනට පවතින උග්‍ර නිලධාරී හිඟය හැකිතාක්දුරට කළමනාකරණය වන පරිදි හා ඒ ඒ අධිකරණවල පවතින අවස්ථානුගත තත්ත්වයන් ද (එනම් නඩු සංඛ්‍යාව, අනුමත කාර්ය මණ්ඩලය, කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ ආදර්ශ අධිකරණ පිහිටුවීම යනාදිය) හා නිලධාරීන්ගේ ඉල්ලීම් හැකිතාක්දුරට සළකා බලමින් මෙම ස්ථානමාරුවීම් සිදුකර ඇත. කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා අනුප්‍රාප්තිකයෙකු ලබාදිය නොහැකි අවස්ථාවලදී එම පුරප්පාඩු නව බඳවාගැනීම් මඟින් ලබාදීමට සටහන් කරගෙන ඇත.

ස්ථානමාරු කිරීම් සිදු කිරීමේ දී ඒ ඒ අධිකරණයන්හි සේවා අවශ්‍යතාවයන් අනුව හැකිතාක්දුරට සීමිත මානව සම්පත කළමනාකරණය කිරීම සිදු කරනු ලැබ ඇති හෙයින් **<u>අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන</u>** ස්ථානමාරු නියෝග අනුව සියලුම නිලධාරීන් නියමිත පරිදි මුදාහැරිමට ක්‍රියා කළ යුතුය.

මෙම ස්ථාන මාරු නියෝග එපරිද්දෙන් ක්‍රියාත්මක නොකිරීමෙන් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵල පිළිබඳ වගකීම ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුව තිබූ <u>දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පැවරෙන බව</u> මෙයින් අවධාරණය කෙරේ. මේ සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 27 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

02. මෙම ස්ථාන මාරු ලබා දීමේදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්ථාන මාරු උපදෙස් නියමිත පරිදි අනුගමනය කරමින් 2024.07.19 දිනැති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ ලිපිය අනුව වර්තමාන සේවා ස්ථානයේ වසර 04 ක කාලයක් සම්පූර්ණ කරන ලද එක් එක් සේවාවන්ට අයත් නිලධාරීන් හට ප්‍රමුඛත්වය ලබා දී ඇත. ඒ අනුව ඔවුන් විසින් එවන ලද ස්ථාන මාරු අයදුම්පත්හි අයදුම් කර ඇති ස්ථාන තුනෙන් (03) එකක් හැකිතාක්දුරට ලබා දී ඇත. එසේ අයදුම් කර ඇති ස්ථාන තුනෙන් එකක් ප්‍රායෝගිකව ලබාදිය නොහැකි අවස්ථාවලදී පමණක් නිලධාරීන්ගේ පදිංචි ස්ථානයන්ට සාපේක්ෂව ආසන්නතම වෙනත් සේවා ස්ථානයක් ලබා දී ඇත. තවද වර්තමාන සේවා ස්ථානයේ වසර 04 සම්පූර්ණ නොවූ නමුත් විවිධ හේතු මත ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන්ගේ අයදුම්පත් ද හැකිතාක්දුරට සළකා බලා මෙම ස්ථාන මාරු ලබා දී ඇති බව අවධාරණය කරනු ලැබේ.

03. ඉහත 2024.07.19 දිනැති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ ලිපියේ සඳහන් උපදෙස් පරිදි අයදුම්පත් ඉදිරිපත් කළ යුතු නමුත් එසේ අයදුම්පත් ඉදිරිපත් නොකල නිලධාරීන්ට ද <u>සේවා අවශ්‍යතාවය මත</u> ස්ථාන මාරු ලබා දී ඇත.

04. 2024.07.19 දිනැති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ ලිපියේ අංක 03හි සඳහන් කරන ලද "වර්තමාන සේවා ස්ථානය පිහිටි අධිකරණ සංකීර්ණයේ වෙනත් අධිකරණයන් ද නම් නොකළ යුතුය." යන්න පවතින පුරප්පාඩුවලට සාපේක්ෂව අඩු ඉල්ලුමක් ඇති අධිකරණ සංකීර්ණ වන **කොළඹ අලුත්කඩේ, පොළොන්නරුව, පුත්තලම, නුවර එළිය, අම්පාර, වවුනියාව සහ මන්නාරම** යන අධිකරණ සංකීර්ණයන්හි නිලධරයන් විෂයෙහි ව්‍යතිරේඛී අවස්ථාවක් සේ සළකා කටයුතු කර ඇත.

05. අධිකරණ ලිපිකරු හා අධිකරණ පොත් බැඳුම්කරු යන තනතුරු ආශ්‍රිතව රත්නපුර හා බදුල්ල දිස්ත්‍රික්ක තුළත් අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක තනතුරු ආශ්‍රිතව දකුණු පළාත තුළත් ඇති වී ඇති සුවිශේෂී තත්ත්වයන් සළකා බලා ඉහත කී පළාත්වල ස්ථිර පදිංචිය ඇති එම පළාත්වලින් පිටත වසර 06කට වඩා සේවය කළ නිලධරයන්ට තම ස්ථිර පදිංචි පළාත්වලට ස්ථාන මාරු ලබා දී ඇත. ඉහත කී සුවිශේෂී තත්ත්වයන් සළකා බලා 2024 වාර්ෂික ස්ථාන මාරු සිදුකිරීමේ දී එම පළාත්වලින් පිටත පළාතකට ස්ථානමාරු ලබාදුන් ඉහත කී සේවා ගණවල නිලධාරීන්ගේ ඉල්ලීම් ද හැකිතාක්දුරට සළකා බලා ස්ථාන මාරු ලබාදීමට කටයුතු කර ඇත.

06. ඉහත 05 ඡේදය පරිදි ස්ථානමාරු ලබාදීම හේතුවෙන් ඇතිවන පුරප්පාඩු සහ සේවා අවශ්‍යතාව සපුරාලීම සඳහා 2024.07.19 දිනැති වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් කැඳවීමේ ලිපියේ 4.1, 4.2, 4.3, සහ 4.4 යටතේ ඉල්ලුම් කළ යුතු නිලධාරීන්ගෙන් වැඩිම සේවා කාලයක් සහිත නිලධාරීන්ට තම පදිංචි පළාතෙන් පරිබාහිර වෙනත් ආසන්නතම පළාත් වෙත ස්ථානමාරු ලබා දීමට කටයුතු කර ඇත.

07. ආදර්ශ අධිකරණ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන අධිකරණවල සේවයේ නියුතු නිලධාරීන් එම අධිකරණවල රඳවා ගැනීමට ආයතන ප්‍රධානීන් විසින් ඉල්ලා ඇති අවස්ථාවලදී මගේ සමාංක හා 2024.08.23 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය පරිදි කටයුතු කර ඇත.

08. අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමයකින් තොරව අධිකරණවලින් පරිබාහිර ආයතනවලට දීර්ඝ කාලයක් තිස්සේ අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වෙනත් අධිකරණ වෙත ස්ථානමාරු කර ඇත.

09. නව බඳවාගැනීම් නොමැතිවීම නිසා 2024 වාර්ෂික ස්ථානමාරුවලින් ස්ථාන මාරු ලබාදී නැවත නියමයක් කරන තුරු අත්හිටුවන ලද ඇමුණුම - Bහි (Annexe - B) සඳහන් ස්ථාන මාරු මෙයින් අවලංගු කරනු ලැබේ.

10. තවද එක් එක් සේවා ගණයට අයත් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කළ අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ඔවුන්ගේ ඉල්ලීම් අනුව හැකිතාක්දුරට පහසු සේවා ස්ථාන වෙත අනුයුක්ත කරනු ලැබ ඇති අතර එම අනුයුක්ත කිරීම වෙනුවෙන් ඔවුන්ට <u>ගමන් වියදම් හිමිකම් නොමැති බව</u> අවධාරණය කෙරේ.

11. ස්ථාන මාරුවීම් ලද ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන් මුදා හැරීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

- වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් අඩ වැටුප් ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම්, අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩවැටුප් ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩවැටුප් ප්‍රසූත නිවාඩු හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

ඒ අනුව ප්‍රසූත නිවාඩු මත සිටින නිලධාරිනියන් ස්ථාන මාරු නියෝග මත වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරිය යුත්තේ ඔවුන්ට අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් කර වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් අනතුරුවය.

12. දැනට සේවය කරනු ලබන ස්ථානයන්හි වසර හතරක (04) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ස්ථානමාරු සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව <u>ගමන් වියදම් සඳහා හිමිකම ඇත</u>. කෙසේ වෙතත් වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථානමාරු වෙනුවෙන් <u>ගමන් වියදම් හිමිකම් ලැබෙන්නේ එම නිලධාරීන්ගේ ඉල්ලීමකින් තොරව සේවා අවශ්‍යතාවය මත අදාල ස්ථාන මාරු නියෝග කර ඇත්නම්</u> පමණි.

13. මෙම ස්ථාන මාරු නියෝග පරිදි අධිකරණයෙන් මුදාහැරීමට නියමිත සියලුම නිලධාරීන් නියමිත දිනට මුදාහැරීමට කටයුතු කරන බවට මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය (ආකෘතිය - I) මඟින් ස්ථානමාරු අභියාචනා පල කිරීමෙන් අනතුරුව දන්වන්න.

14. ඉල්ලා ඇති අධිකරණ තුනෙන් එකකට හෝ එම අධිකරණ පිහිටි අධිකරණ සංකීර්ණයක වෙනත් අධිකරණයකට ස්ථාන මාරු ලද නිලධාරීන් <u>නැවත අභියාචනා ඉදිරිපත් නොකල යුතුය.</u>

15. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අධිකරණ සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පල කර ඇති පරිදි දී ඇති උපදෙස් අනුව MS Word document (දිගුව මඟින් අයදුම්පත බාගත හැකිය) මඟින් **2024.12.04 වන දින පස්වරු 3.00 හෝ එදිනට පෙර ඊ මේල් මඟින්** ඉදිරිපත් කළ යුතු අතර දෘඩ පිටපත එවීම අනිවාර්යය වේ. තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එක් එක් සේවා ගණ අනුව අදාළ ආකෘතිපත්‍ර නිවැරදිව සම්පූර්ණ කර **2024.12.04** දිනට ප්‍රථම ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"පිරිස් පාලන අංශය - වාර්ෂික ස්ථානමාරු අභියාචනා 2025"** යනුවෙන් සඳහන් කර <u>ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, අලුත්කඩේ, කොළඹ - 12</u> යන ලිපිනයට එවිය යුතුය. (2025 වාර්ෂික ස්ථානමාරු අයදුම් කිරීමේදී අමුණා එවන ලද වෛද්‍ය වාර්තා නැවත එවීමට අවශ්‍ය නොවන අතර වාර්ෂික ස්ථානමාරු අයදුම් කිරීමෙන් පසු ලබා ගත් වෛද්‍ය වාර්තා ඇත්නම් පමණක් යොමු කිරීම ප්‍රමාණවත් වේ.)

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 නොවැම්බර් මස 27 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

ආකෘතිය - I

අධිකරණයේ නම: ..........................................................................

<u>**2025 - වාර්ෂික ස්ථානමාරු ලැබූ නිලධාරීන්**</u>

1. අධිකරණ රෙජිස්ට්‍රාර්
2. අධිකරණ පවුල් උපදේශක
3. වැඩසටහන් සහකාර,ගිණුම් සහකාර, සංවර්ධන නිලධාරී සේවය
4. අධිකරණ භාෂණ පරිවර්තක
5. අධිකරණ ලිපිකරු
6. අධිකරණ ලඝු ලේඛක
7. අධිකරණ යතුරු ලේඛක
8. අධිකරණ පොත් බැඳුම්කරු

ඉහත සඳහන් නිලධාරීන් 2025.01.06 දින සිට ස්ථාන මාරු අනුව නව සේවා ස්ථානවල සේවය කිරීමට හැකි වන පරිදි මෙම අධිකරණයෙන් මුදා හරිනු ලබන බව මෙයින් දන්වමි.

පරීක්ෂා කර බලන ලදි.

රෙජිස්ට්‍රාර්ගේ නම: ..................................................................................................

..................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව

............................................